# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,921 — 1918ක්වූ ජනවාරි මස 25වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කරණලද ප්‍රකාශපත්‍රයයි.

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයත් යන එක්සත් රාජධානියේද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රටවලද රාජාභිෂෙකලත් සමය සංරක්‍ෂකවූ නෙකශ්‍රීන් විරාජමානවූ පස්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්.

සෙන්ට් මයිකල් සහ සෙන්ට් ජෝර්ජ් යන අති විශිෂ්ට පඞ්කතියේ නෙට් ග්‍රෑන්ඩ් ක්‍රොස්වූද බාත් යන අති
ගරුකටයුතු පඞ්කතියේ නයිට් කොමෑන්ඩර්වූද, ලඞ්කාද්වීපයේ සහ ඊට යටත් ප්‍රදේශවලද
ආණ්ඩුකාර ධූරන්ධරවූද, ප්‍රධාන සේනාධිපතිවූද, සර් ජෝන් ඇන්ඩර්සන්
උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද

**ප්‍ර කා ශ ප ත්‍ර ය යි.**

**ජෝන් ඇන්ඩර්සන්.**

වර්ෂ 1910යේ පණවනලද නොම්මර 6 දරණ නාගරික සභා ආඥාපණතේ 109 (1) වෙනි වගන්තියේ නියමයට අනුව යාමෙන් වර්ෂ 1905යේ ඔක්තෝබර් මස 12වෙනි දින ප්‍රකාශපත්‍රයකින් ප්‍රසිද්ධකර සිටින්ට යෙදුන උපාධ්‍යනීති අතුරෙන් VIII. වෙනි පරිච්ඡේදයේ 45වෙනි උපාධ්‍යනීතිය කොළඹ නාගරික සභාව විසින් මෙහි පහත දක්වන ලේඛනයේ සඳහන්කරතිබෙන ප්‍රකාරයට වෙනස්කරන්ට යෙදුනා ඇත. තවද එම ආඥාපණතේ 109 (3) වෙනි වගන්තියේ ප්‍රකාර එකී අමුතුකිරීම කාරක මන්ත්‍රීසභාවේ කැමැත්ත ඇතුව ආණ්ඩුකාරතුමා විසින් ස්ථිරකරන්ට යෙදුනා ඇත.

එකී ආඥාපණතේ 109 (3) යන කාණ්ඩයෙන් අපවෙත පවරාතිබෙන බලයපිට එකී 45වෙනි අතුරුපනතේ එකී අමුතු කිරීම මෙයින් ප්‍රකාශකරන බව සියලුදෙනා විසින් දතයුතුයි.

අපගේ ස්වාමින්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය දහඅටක්වූ ජනවාරි මස විසිඑක්වෙනි දින මෙම ලඞ්කාද්වීප යෙහි නුවරදී දෙවාවදාරනලදී.

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්ණිහ.

**රජතුමාණන් දෙවියෝ රකිත්වා.**

---

කියනලද ලේඛනය.—VIII. වෙනි පරිච්ඡේදයේ 45වෙනි උපාධ්‍යනීතිය.

යම් ගේක හෝ ස්ථානයක් ඇතුළත යම් ගවයෙක්, අශ්වයෙක්, බැටළුවෙක්, එළුවෙක් හෝ ඌරෙක් මැරුණේනම් එහි පදිංචිකාරයා විසින් ඒ බව එම මරණය සිදුවී පැය 4ක් ඇතුළතද රාත්‍රියේ මරණය සිදුවුනීනම් එළිවී පැය 4ක් ඇතුළතදීද එම ස්ථානය පිහිටාතිබෙන පලාතේ නාගරික පශුවෛද්‍ය පරීක්‍ෂකතැනට දන්වාසිටින්ට ඕනෑය. එම පරීක්‍ෂකතැන විසින් මළකුණ සෝදිසිකරබැළුවාට පසු නියමකරණ අනුමතව සභාපතිතුමා විසින් නියමකරණ ස්ථානයකට පදිංචිකාරයාගේ වියදමෙන් එය ගෙනයන්ට ඕනෑය. එසේ නැත්නම් සභාපතිතුමා විසින් නියමකරණ ප්‍රකාරයකට එම මළකුණ ගෙණගොස් වැළලීමට උනාවූ වියදම් පරීක්‍ෂකතැනට ඔහු ගෙවන්ට ඕනෑය.

---

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය නම් එක්සත් රාජ්‍යයෙහිද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය ප්‍රදේශයන්හිද, රාජපදප්‍රාප්ත සමය සංරක්‍ෂක පස්වෙනි ජෝර්ජ් රාජෝත්තමයාණන්වහන්සේගේ නාමයෙන්ය.

ශාන්ත් මයිකල් සහ ශාන්ත් ජෝර්ජ් නම්වූ අතිඋත්තම පංක්තියේ නයිට් ග්‍රෑන්ඩ් ක්‍රොස් නම් පදවියද, බාත් නම්
අතිගරුකටයුතු පංක්තියේ නයිට් කොමෑන්ඩර් නම් පදවියද, ලඞ්කාද්වීපයේ හා ඊට යටත් ප්‍රදේශ
වලද ආණ්ඩුකාර ධූරය හා ප්‍රධාන සේනාධිපති ධූරයද උසුලන්නාවූ සර් ජෝන්
ඇන්ඩර්සන් නම් උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරනලද

**ප්‍ර කා ශ ප ත්‍ර ය යි.**

**ජෝන් ඇන්ඩර්සන්.**

වර්ෂ 1910යේ නාගරික ආඥාපණතේ 109 (1) යන කාණ්ඩයේ පංගාර්තු යටතේ මහනුවර නාගරික සභාව විසින් පණවන ලද මතුදක්වන අතුරුපණත ඉහතකී ආඥාපණතේ 109 (3) වෙනි කාණ්ඩයේ නියමකර තිබෙන ප්‍රකාර කාරක මන්ත්‍රීසභා යෙහිදී උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකර වදාරනලදී.

එකී ආඥාපණතේ 109 (3) වෙනි කාණ්ඩයෙන් ලඞ්කාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වන අප කෙරෙහි පැවරී තිබෙන බලය කරණකොටගෙන ඉහතකී අතුරුපණත මෙයින් ප්‍රකාශකරන බව සියලුදෙනාම දැනගනිත්වා.

අපගේ ස්වාමින්වහන්සේගේ වර්ෂයෙන් එක්වාදහස් නවසිය දහඅටක්වූ ජනවාරි මස දහඅටවෙනි දින ඉහතකී ලංකාවිප යෙහි නුවරදී දෙවාවදුරණලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

**රජතුමාණන් දෙවියෝ රකිත්වා.**

---

**ඉහත සඳහන්කළ අතුරුපණත.**

XIII. වෙනි පරිච්ඡේදය.

ප්‍රසිඞ වීථියකින් මෝටර් රථ තබන ස්ථානයකට ඇතුල්වෙන මාර්ගී.—219A මෝටර් රථ නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරන නොහොත් පාවිච්චිකිරීමට අදහස්කරන යම් ගේක, ඉඩමක, හෝ ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් එම ගේ, ඉඩම, හෝ ස්ථානය යම් වීථියක් අයිනේ කානුවකට නොහොත් "පේව්මැන්ට්" එකකට යාව තිබේනම් නාගරික සභාපතිතුමා විසින් කරන්ට යෙදෙන නියෝගවලට යටහත්ව එතුමා විසින් ඒගැන නියමකරනුලබන තැනකින් හෝ තැන්වලින් මිස එම කානුව හෝ "පේව්මන්ට්" එක හරහ නොහොත් උඩින් මෝටර් රථ ගෙන නොයිය යුතුයි.

---

**උපාධ්‍යා නීති.**

1906යේ නගර පාඨශාලා ආඥාපනත.

ඉහළින් සඳහන්කළ ආඥාපනතේ 7වෙනි, 8වෙනි කාණ්ඩ යටතේ මාතර ලෝකල් බෝර්ඩ් සභාව විසින් සාදනලද මෙහි පහත දක්වන අතුරුපනත් ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ සම්මතය ඇතිව ස්ථිරකරන ලදින් පොදුජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිඞකරනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
(අත්සන්කළේ), ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 9වෙනි දින කොළඹ
මහලේකම්තාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

"වර්ෂ 1906යේ නගර පාඨශාලා ආඥාපනතේ" 7වෙනි සහ 8වෙනි වගන්තිවල ප්‍රකාර
මාතර ලෝකල් බෝර්ඩ් සභාව විසින් පනවනලද අතුරුපනත්.

1. වචනයන්ගේ අර්ථ.—මේ අතුරුපනත්වල "පිරිමි ලමයා" "ගැනු ලමයා" "ලමයා" යන වචනවලින් හැඟෙන්නේ මීට යාකර තිබෙන "ඒ" අක්ෂරය දරණ ලේඛනයේ සඳහන් භූමිප්‍රමාණය තුළ වසන පිරිමි ලමයෙක් ගැනු ලමයෙක් ලමයෙක් යනුයි.

"මව්පිය යන්නෙන්" භාරකාරයාද, ලමයෙක් ඇත්ත වශයෙන් භාරවසිටින අයද ගිණියයුතුවේ. "ව්‍යවස්ථා පොත" යනු ආධාර ලබන පාඨශාලා ගැන මන්ත්‍රණ සභාවේදී ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් අනුමතකරනලදුව එකලට වලංගුවන ව්‍යවස්ථා පොතයි.

"පාඨශාලාවට පැමිණීම" යන පාඨයෙන් හැඟෙන්නේ ව්‍යවස්ථා පොතේ ප්‍රකාරයට පැමිණීමේ ලේඛන පොතක සටහන් කළහැකි පැමිණීමේ සම්පූර්ණ කාලය හැටියට ව්‍යවස්ථා පොතේ නියමකොට තිබෙන කාලේදී පැමිණීමයි.

"ස්ථානික බලසි" යන පාඨයෙන් හැඟෙන්නේ මාතර ලෝකල් බෝර්ඩ් සභාවයි.

"පාඨශාලාව" යන්නෙන් හැඟෙන්නේ මීට යාකරනලද "බී" ලේඛනයේ සඳහන්වූ පාඨශාලාවකි.

ලමයෙකුගේ ඉගනීමට ප්‍රමාණවූ යෝග්‍ය පිළිවෙළ යොදාගැන්ම සහ "සැලකියයුතු හේතුව" යනමේ පාඨවලින් හැඟෙන්නේ වර්ෂ 1906යේ නගර පාඨශාලා ආඥාපනතේ 8වෙනි වගන්තියේ පළමුවෙනි අතුරුවගන්තියේ (B) කොටසයේ විස්තරකරනලද අර්ථයෝ වෙත්.

"පාඨශාලා පරීක්ෂක" යනු ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පත්කරනලද පාඨශාලා පරීක්ෂක කෙනෙකි. තවද පාඨශාලා උප පරීක්ෂක කෙනෙක්ද මීට ඇතුළත්වේ.

2. පාඨශාලාවට පැමිණිය යුතු ලමයි.—වයස අවුරුදු හයට අඩුනුවූ 12ට වැඩිනුවූ යම් පිරිමි ලමයෙකුගේද වයස අවුරුදු හයට අඩුනොවූ 10ට වැඩිනුවූ යම් ගැනු ලමයෙකුගේද ඉගෙනීම සඳහා ඔවුන්ගේ දෙමව්පියන් විසින් වෙනත් ඉගෙනීමට ප්‍රමාණවූ යෝග්‍ය පිළිවෙළක් යොදා නැතහොත් නොහොත් පාඨශාලාවට නොපැමිණීමට සැලකියයුතු හේතුවක් නොදක්වනලදහොත් ඔවුන්ගේ දෙමව්පියන් විසින් එකී පිරිමි ලමයා හෝ ගැනු ලමයා මීට යාකර තිබෙන ලේඛනයේ පෙනෙන පාඨශාලාවකට යැවිය යුතුයි. මහමදගම්කාර ලමයින්ගේ දෙමව්පියන් විසින් වයස අවුරුදු අටකට අඩුනුවූද 12කට වැඩිනුවූද පිරිමිලමයින් හා වයස අවුරුදු අටකට අඩුනුවූද දහයකට වැඩිනුවූද ගැනු ලමයිනුත් පාඨාලශාවට යැවීම සැලැස්විය යුතුයි. එසේදවුවත් හැතැප්ම දෙකකට වඩා ඈත්වූ පාඨශාලාවකට ගැනු ලමයෙක් යැවීම ගැනද, හැතැප්ම තුනකට වඩා ඈත්වූ පාඨශාලාවකට පිරිමි ලමයෙක් යැවීම ගැනද බලකරනු නොලැබේ.

3. පැමිණ සිටීමේ කාලය.—යම් පිරිමි ලමයෙක් හෝ ගැනු ලමයෙක් පාඨශාලාවේ සිටියයුතු කාලයනම් ඔවුන්ගේ වයසේ ලමයින්ට ඉගැන්වීම පිණිස පාඨශාලාව විවෘතකර තිබෙන මුළු කාලයවේ.

4. ආගම.—(a) වර්ෂ 1906යේ නගර පාඨශාලා ආඥාවේ 9වෙනි වගන්තියේ (2) (d) අතුරු වගන්තියේ ප්‍රකාර පාඨශාලාවේ ආගම ධර්මය උගන්වන කාලයතුළ යම් ලමයෙකුට මහහැර ඉඳීමට තහනමක් නැත.

(b) යම් ලමයෙකුගේ මව්පියන්ට අයිතිවූ ආගමේ ක්‍රියාවන් කරගැනීම පිණිස වෙන්කරනලද කිසිම දවසකද යම් ලමයෙක් පාඨශාලාවකට පැමිණීමගැන බලනොකෙරේ.

5. තවද අවුරුදු 10ටත් 12ටත් අතරේ වයස ඇති ලමයෙක් මාතර නාගරික සභාවේ ප්‍රධානතැනගේ පිළිගැන්මේ ප්‍රකාර ප්‍රයෝජනවත් රක්ෂාවක යෙදීසිටිනම් හෝ කලට වලංගුවූ ව්‍යවස්ථා පොතේ ප්‍රකාරයට කියවීම, ලිවීම හා ගණිතයෙන් හතරවෙනි ප්‍රමාණයෙන් සමත්වූයේයයි පාඨශාලා පරීක්ෂකකෙනෙකුගෙන් සහතික පත්‍රයක් ලද්දේනම් ඔහුගේ පාඨශාලාවට පැමිණීම වුවමනා නොකෙරේ.

6. මේ අතුරුපනත් හෝ ඉන් කොයියම් එකක්වුවත් නොසැලකීම අතපසුකිරීම හෝ කඩකිරීමගැන යම් මව් පියෙක් වරදකාරයා වුවහොත් එකී වැරැද්දට රුපියල් 20කට වැඩිනොවන දඩයකට යටත්විය යුතුයි.

යම් ලමයෙක් මාසයක් ඇතුළත සෙකෝලය පවත්වන දවස්වලින් පහෙන් කොටසකට වැඩි කාලයක් සෙකෝලයට නොපැමිණියොත් ලමයාගේ දෙමව්පියන්ට විරුඞව නඩුපවරනුලැබේ.

විස්තර (සිහිකටයුතු තොරතුරු) මෙම අතුරුපණත්වල 1වෙනි වගන්තියේ කියනලද නගර පාඨශාලා නීතියේ කොටස් නම්:—8වෙනි වගන්තියේ පළමුවෙනි අතුරුවගන්තියේ B කොඨාසය, යම් මව්පියෙක් විසින් තමාගේ දරුවා ආධාරලැබීම පිණිස ඉගැන්වීමේ අධ්‍යක්ෂකතැන විසින් ලියාපදිංචිකරන්ට ඉල්ලන ලදුව එසේ කිරීමට කල්පනාවපිට තිබෙන පාඨශාලාවකට හෝ ප්‍රමාණවූ යෝග්‍යවූ ඉගැන්වීම කරන තැනක්යයි අධ්‍යක්ෂකතැන විසින් ලියාපදිංචිකරනලද පාඨශාලාවකට හෝ ආධාරලැබීම පිණිස ලියාපදිංචිකරන්ට ඉල්ලනලදුව එසේ කිරීමට තවම කල්පනාවපිට තිබෙන පාඨශාලාවකට හෝ ප්‍රමාණවූ යෝග්‍යවූ ඉගැන්වීම කරන තැනක්යයි අධ්‍යක්ෂකතැන විසින් සහතික කරනලද පාඨශාලාවකට හෝ නොකඩව යන්නේය කියා හෝ දරුවාගේ ඉගැන්වීම පිණිස අධ්‍යක්ෂකතැන විසින් යෝග්‍යවූ ප්‍රමාණයයි සහතික කටයුතුසේ වෙනයම් පිළිවෙළක් යොදාගෙනතිබේයයිකියා හෝ දරුවා පාඨශාලාවට යැවීමෙන් නිදහස් කළයුතුයයි අධ්‍යක්ෂකතැනගේ සහතිකයක් පෙන්වා සිටියහොත් එකී තැනැත්තා තම දරුවාගේ ඉගැන්වීම පිණිස ප්‍රමාණවූ යෝග්‍යවූ පිළිවෙළක් යොදාගෙන තිබේයයි සලකනුලැබේ. එසේදවුවත් යම් ලමයෙක් පාඨශාලාවට යවනු නොලැබූයේ සැලකියයුතු හේතුවක් නිසායයි උසාවියට ඒත්තුයනසේ ඔප්පුකළොත් එසේ නෑරීම ගැන ඔහුගේ මව්පියෝ වැරදිකාරයෝකරනු නොලැබෙත්. යම් ලමයෙකුගේ අසනීපයක් හෝ වැළැක්විය නොහැකි කරුණක් නිසා පාඨශාලාවට යැවීම නොහැකිවීයයි ඔප්පුකළොත් පාඨශාලාවට නොයැවීම පිණිස සැලකියයුතු හේතුවක් තිබුණේයයි පිළිගනුලැබේ.

9වෙනි වගන්තියේ දෙවෙනි අතුරුවගන්තියේ D අක්ෂරය දරන කාණ්ඩය:—ආගම ධර්මය උගන්වන පාඨශාලාවක් ලෝකල්බෝඩ් සභාව විසින් පහත දක්වන කාරණයන්ගෙන් සම්පූර්ණයයි පිළිගතහොත් මිස නැතහොත් ප්‍රසිද්ධ ස්වභාෂා පාඨශාලාවක් මෙන් පිළිගනුනොලැබේ.

(a) ආගමධර්මය උගන්වන්නේ කාලසටහනින් සඳහන් කාලයතුළ පමණක් වියයුතුයි.

(b) පාඨශාලාවට අයිතිවූ ආගමේ හැර අන්‍ය ආගම්වල ශිෂ්‍යයන්ට ආගමධර්මය උගන්වනවාට ඔවුන්ගේ දෙමව්පියෝ විරුද්ධනම් එසේ නොකළයුතුයි.

(c) ආගමධර්මයේ පාඩමට නොසිටින ලමයි ඒ කාලයතුළ අන්‍යවූ ඉගෙනීමක යෙදිය යුතුවෙති.

(d) එබඳු ලමයි ආගමධර්මය උගන්වනුලබන කාලයතුළ එම කාමරයේ සිටිනවාට මව්පියෝ විරුද්ධනම් ඔවුන්ට පාඨශාලාවේ අන්‍ය කොටසක ඉගෙනීම කරන්ට ඉඩහැරිය යුතුයි. නැතහොත් ඒ කාලය තුළ පාඨශාලාවෙන් බැහැරගොස් සිටින්ට ඉඩහැරිය යුතුයි.

ඉහත පෙනෙන අතුරුපණත් මාතර ලෝකල් බෝර්ඩ් සභාව විසින් වර්ෂ 1916ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින පවත්වනලද රැස්වීමේදී පනවනලදී.

"ඒ" අක්ෂරයේ කැබැල්පත්‍රය.

මාතර ලෝකල් බෝඩ් නම් නගර සභාවට අයත් මායිම්:—උතුරට නායිමන් තොටුපළ ළඟ නිල්වලාගඟට යනතුරු තිබෙන පාරේ දකුණු පැත්තේ අඩි 900ක් බස්නාහිර දෙසට තැන්නහේනට යන පාර දක්වාද, එතන සිට තැන්නෙහේනට යන පාරේ දකුණුපැත්තෙන් තැන්නෙහේන කියන කන්දළඟටද, එතන සිට කන්දඅද්දර දිගට ගොස් වල්පළ කුඹුරු දක්වාද, එතන සිට කුඹුරුවල දකුණු පැත්තෙන් කිතුලේවල යකඩපාලමට අඩි 150ක් දුරින් හක්මන පාර දක්වාද, එතන සිට තුඩාව මැදින් සෑදීමට පටන්ගෙන තිබෙන පාරේ බස්නාහිර දෙසටද, එතන සිට නූපේ ඇල පටන් අකුරැස්ස පාරේ හැතැප්ම තුන්කාලේ කනුව ළඟට වැටෙන පාරේ දකුණු පැත්තෙන්ද; බස්නාහිරට මාතර අකුරැස්ස පාරේ හැතැප්ම තුන්කාලේ කනුවෙන් දකුණට අඩි 270ක් ඈතින්ද, එතන සිට ගම්සභා පාරේ නැගෙනහිර පැත්තෙන් මාතර වෙලේගොඩ පාරේ පළමුවෙනි හැතැප්ම කණුව දක්වා දකුණු දෙසටද, එතන පටන් මාතර වෙලේගොඩ පාරේ දකුණු පැත්තෙන් පළමුවෙනි හැතැප්ම කණුවේ සිට අඩි 550ක් දුර දක්වාද, එතන සිට ගම්සභා පාරේ නැගෙනහිර පැත්තෙනි පටන්ගෙන ගාලු මාතර මහපාරේ 98¼ හැතැප්ම කණුව දක්වා දකුණටද, එතන සිට එකී මහපාරේ දකුණු පැත්තෙන් පටන්ගෙන 98වේ හැතැප්ම කණුව දක්වා බස්නාහිර දෙසටද, එතන සිට දකුණු දෙසින් මහපාරේ පටන් තළන්විල ඇල දක්වා හරි කෙළින් ඉරක්ද, එතන පටන් එම ඇලේ දකුණු ඉවුර දිගේ පොල්හේනේ හරස් පාර දක්වාද, එතන පටන් පොල්හේනේ හරස් පාරේ නැගෙනහිර දිගට ගොස් මඩිහ-පොල්හේන හරස් පාරේ මන්සන්දිය දක්වා දකුණු දිගටද, එම මඩිහ-පොල්හේන පාරේ සිට හරි කෙළින් මුහුද දක්වා ඉරක්ද; දකුණට මුහුද; නැගෙණහිරට මුහුදේ සිට එලියකන්දේ වැස්ලියන් මෙතොදිස්ත සභාවට අයිති ස්කෝලය දක්වා ඉරක්ද, එකී ඉර එලියකන්ද-මැද්දවත්ත පාර දෙසින් එන ඉරට එක්ව පවතිනවා ඇත, එතන සිට එලියකන්ද-මැද්දවත්ත පාරේ බස්නාහිර දෙසින් තම්ගල්ල පාර දක්වාද, එතන සිට තම්ගල්ලේ පාරට අඩි 700ක් උතුරට කෙළින් ඉරක්ද, එතන සිට නිල්වලාගඟ දක්වා බස්නාහිර දෙසට කැකනදුරේ නායිමන පාරවල් තම්ගල්ලේ පාරේ සිට අඩි 700ක් දුරදී පසුකර එතන සිට උතුරු දෙසට නිල්වලාගඟ දිගට නායිමන තොටුපළ දක්වාද.

"බී" අක්ෂරයේ කැබැල් පත්‍රය.

රෝමානු කතෝලික සභාවට අයත්.

1. මාතර ශුද්ධවූ සර්වේසියස්ගේ පිරිමි පාඨශාලාවද
2. මාතර ශුද්ධවූ මේරිගේ ශිෂ්‍ය නිවාස පාඨශාලාවද
3. මාතර ගැහැනු ශිෂ්‍ය නිවාස කාර්මික පාඨශාලාවද

එන්ගලන්ත සභාවට අයත්.

4. මාතර ශු. තෝමස්ගේ පිරිමි පාඨශාලාවද
5. එම ගැහැනු පාඨශාලාවද
6. නූපේ ශිෂ්‍යයින් පුහුණුකිරීමේ සහ කාර්මික පාඨශාලාවද
7. ගබඩාවීදියේ මිශ්‍ර පාඨශාලාවද
8. මාතර කොටුවේ මිශ්‍ර පාඨශාලාවද
9. නූපේ ගුරුවරුන් පුහුණුකිරීමේ පිරිමි පාඨශාලාවද
10. පල්ලිමුල්ලේ මිශ්‍ර පාඨශාලාවද

වැස්ලියන් මෙතොදිස්ත සභාවට අයත්.

11. මාතර ගැහැනු පාඨශාලාවද
12. මැද්දේවත්තේ ගැහැනු ශිෂ්‍ය නිවාස පාඨශාලාවද
13. මැද්දේවත්තේ පිරිමි පාඨශාලාවද
14. පල්ලිමුල්ලේ ගැහැනු පාඨශාලාවද
15. පම්බුරන මිශ්‍ර පාඨශාලාවද

බුද්ධාගමට අයත්.

16. කඩවීදියේ මිශ්‍ර පාඨශාලාව
17. වේරගම්පිට මිශ්‍ර පාඨශාලාව

වර්ෂ 1918වේ ශ්‍රීපාද වන්දනාකාලයේදී වසංගත රෝගය හෝ වෙනත් රෝග වලක්වන පිණිස පණවනලද නියෝග.

වර්ෂ 1918වේ අවුරුද්දේ වන්දනාකාලය තුළ වසංගත රෝගය හෝ වෙනත් රෝග වලක්වන පිණිස පණවනලද මෙහි පහත සඳහන්වෙන නියෝග වන්දනාකාරයන් විසින් පිළිපදින්ට ඕනෑය.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 16වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

බී. කොන්ස්ටැන්ටයින්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වම්හ.

1. සුදු කොඩියක් එසවීමෙන් නියමකර තිබෙන ස්ථානවලින් පමණක් බීමට සහ කෑම පිසීට පිණිස වතුර ගතයුතුයි. එකී ස්ථාන අසල වතුර කිසිම කෙනෙක් විසින් මොනම කාරණාවක් නිසාවත් කිළුටුකිරීම තහනම්ය.
2. නාන ස්ථාන රතු කොඩි එසවීමෙන් පෙන්වා ඇත.
3. අම්බලමක හෝ මඩමක සිට යාර සියයකට නොහොත් බඹ පණහකට මෑත අපිරිසිදුකිරීම හාත්පසින්ම තහනම්ය.
4. අම්බලම්, කඩ සහ නවාතැන්පල් බැලීමට සහ සාමාන්‍යයෙන් පිරිසිදුකම පැවැත්වීමට මුලාදෑනි පත්කර ඇත.
5. යම් අසනීපයක් හැඳුන වහාම සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැනට දන්වන්ට ඕනෑය.

## ඉඩම් විකිණීම්.

ගාලු දිස්ත්‍රික්කේ මෙහි පහත සඳහන්වෙන මිනිරන් තිබෙන වාය කියා කල්පනාකර තිබෙන රජසන්තක ඉඩම්වල අවුරුදු පහකට මිනිරන් හෑරීමේ බද්ද ගාළු දිස්ත්‍රික්කේ ඒජන්ත උන්නාන්සේ විසින් ගාල්ලේ කච්චේරියේදී මෙහි පහත දක්වන කොන්දේසි පිට වර්ෂ 1918ක්වූ මාර්තු මස 12වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත.

(*a*) එම බද්ද ආණ්ඩුවෙන් පණවනලද නියෝගවලට සහ කොන්දේසිවලටත් යටත්ව අවුරුදු පහක, අවුරුද්දට අක්කරයට රුපියල් 10 බැගින් බිම්බද්ද ගෙවන්ට ඕනෑවා පමණකුත්නොව අවුරුදු පහකට මිනිරන් හෑරීම පිණිස හතරවෙනි තීරයේ සඳහන්කර තිබෙන තක්සේරු මුදලට හෝ ඊට වඩා ඉල්ළුම්කාරසින්ගෙන් වැඩි ඉල්ළුම්කාරයා ගැනුම්කාරයා වෙනවා ඇත. එකී කොන්දේසිවල පිටපතක් මේ කච්චේරියෙන් ලබාගන්ට පුළුවන.

(*b*) විකිණීම අවසානවුන වහාම වැඩි ඉල්ළුම්කාරයා කියනලද අය ඉල්ලුම්කළ මුදලෙන් සියයට දහය වන මුදලක් ඔහු ප්‍රථම යම් මුදලක් කච්චේරියේ තබා තිබුනා හෝ නොතිබුනා හෝ ඒජන්ත උන්නාන්සේට නොගෙව්වොත් හෝ ඉහත පෙණෙන විකිණීමේ කොන්දේසි අත්සන් නොකළොත් ගැණුම්කාරයා නොවන්නේය.

(*c*) ගැණුම්කාරයා විකුණපු දින පටන් මාසයක් ඇතුළතදී ඉතුරු මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට ඕනෑය. එසේ නොකළොත් විකිණීම ස්ථිර නොවෙනවා පමණකුත්නොව ගෙවනලද සියයට දහයේ මුදලද ආණ්ඩුව සන්තක වෙනවා ඇත.

(*d*) නියමකර තිබෙන කාලය තුළදී එකී මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට යෙදුනොත් උන්නාන්සේ විසින් ගැණුම්කාරයාට නියම පෝර්මයේ බදු ඔප්පුවක් දෙන්ට යෙදෙනවා ඇත. ඔහු එවලේම එහින් පිටපතක් ඒජන්ත උන්නාන්සේට දෙන්ට ඕනෑය.

(*e*) ඒ ඉඩම් විස්තරකිරීමෙහි හෝ මැනීමෙහි යම් වැරැද්දක් පසුව දැනගන්ට ලැබුනා ඇද්ද ගැණුම්කාරයා විසින් ගත් මුදලෙන් අඩුකිරීමක් කරන්ට ආණ්ඩුව බැඳී නැත.

(*f*) බදු ඔප්පුව සෑදීමේ ගාස්තුව මිලේටගත් මුදලෙන් සියයට හතර බැගින් රුපියල් 20ට වැඩිනොවන ගණනක් වේ. එය විකිණීම දවසේදී ගෙවන්ට ඕනෑය.

(*g*) දරවල සහ දුවවල වටිනාකම විකුනුම්දින ගෙවන්ට ඕනෑය.

(*h*) හාරපු වළවල් බද්ද අවසානයේදී වසාදමන්ට ඕනෑය.

බෙන්තොට වලල්ලාවිටිකෝරලේ.

ප්ලෑන 10,640. ගම—හත්තක.

| නො. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. | තක්සේරුව. රු. |
|---|---|---|---|---|---|
| 1 | පුස්වැල්ගොඩකන්දේහේන නොහොත් මානගේවත්තේඋඩුමුල්ල | 0 | 3 | 10 | 1,500 |
| 3 | මානගේවත්තේමානාන නොහොත් ගුලනේකන්දේහේන .. | 1 | 0 | 10 | 500 |
| 5 | පුස්වැල්ගොඩකන්ද නොහොත් මානගේඅද්දර .. | 1 | 0 | 1 | 500 |

වැල්ලබඩපත්තුව. ගම—බටපොල නැගෙණහිර.

| නො. | ඉඩමේ නම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|
| 1 | වැලිපොල්ලෙව්ව .. | 1 | 0 | 0 | 500 |
| 2 | කොන්දගල .. .. | 1 | 0 | 0 | 500 |
| 3 | දික්කැලේ .. .. | 1 | 0 | 0 | 500 |

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ඒජන්තඋන්නාන්සේ.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 22වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

---

**No. 2,132, N.W.P.**—වයඹ දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 27වෙනි දිනවූ බදාදා පස්වරු 1ට කුරුනෑගල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන් යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ වන්නි සහ වැළිඩවිල්ලි හත්පත්තුවල පිහිටාතිබෙන බිම්කැබලි 35ක්.

සිතියම 4,327. ගම—හතලිස්පහ බස්නාහිරකෝරලේ බුළුවැව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2055 | තඹලයාය | .. ඇන්. ක්‍රිස්නාසාමි .. | .. පොල් නොහොත් දුම්කොල වැවීමට සෑහෙන කැලේ | 29 | 2 | 16 | 55 |

සිතියම 4,349. ගම—මීඔයෙන් එගොඩකෝරලේ මහනාන්නේරිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 2112 | තිඹිරිවලකුඹුර | .. මල්හාමි කෝරාල විසින් ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගත් හරිය | .. කුඹුර .. | .. 0 | 3 | 0 | 55 |

මෙම ඉඩමට අයිතිකම්කියන්නෙක් නැහැ.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 2113 | ලින්වලහේන | .. මල්හාමි කෝරාල විසින් ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගත් හරිය | .. පුංචිකැලේ සහ උස්බිම | .. 0 | 0 | 32 | 55 |

සිතියම 4,378. ගම—මාගුල්ඹතොටකෝරලේ බුදුමුත්තාව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 2173 | ගුරුවතියපාවුලහේන | තෙන්නකෝන්මුදියන්සෙලාගේ අප්පුහාමි හිටපු ඔපිසර සහ එම මුදියන්සේ | . හේන .. | .. 1 | 2 | 20 | 23 |

සිතියම 4,589. ගම—මාගුල්ඹතොටකෝරලේ දන්ඩුවාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | පුහුලිදවලයාය | .. බලගොල්ලාගම හේරත්මුදියන්සෙලාගේ පුංචිරාල | කුඹුරු අස්වැද්දීමට සෑහෙන කැලෑඉඩම | .. 5 | 2 | 18 | 30 |

සිතියම 4,591. ගම—මාගුල්ඹතොටකෝරලේ බුදුමුත්තාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | බුදුමුත්තාවපුහුල්දයාය .. | නිකවැරටියේ ආර්. බී. ද සිල්වා | .. කුඹුරු අස්වැද්දීමට සුදුසු කැලෑඉඩම | .. 4 | 1 | 9 | 20 |
| 8 | එම .. | එම | .. කුඹුර .. | .. 0 | 1 | 29 | 20 |

සිතියම 4,600. ගම—මාගුල්ඹතොටකෝරලේ හාකාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | රනවරහේන | .. අඹගස්වැවේ දිසානායකමුදියන්සේලාගේ කවුරාල හිටපු විදානේ | .. කුඩාකැලේ | .. 3 | 3 | 25 | 20 |

සිතියම 4,603. ගම—නැගෙණහිර හතලිස්පහකෝරලේ අත්තාරගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මොරගොල්ලවයාය | .. ඒරියාවේබැද්දේ වන්නිහාමිලාගේ කපුරු හාමි | කුඩාකැලේ හල්මිල්ලගස් සවලපයක් තැනතැන තිබේ | 23 | 0 | 19 | 23 |

අයිතිකම කියන්නා—ආණ්ඩුව, (නොවිකිනීම පිණිසයි).

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | එම .. | — | .. දියපාරට ඉතුරුකර තිබෙන හරිය .. | .. 11 | 0 | 25 | — |
| 3 | එම .. | — | .. පාරට ඉතුරුකර තිබෙන හරිය.. | .. 0 | 1 | 24 | — |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | සිතියම 4,604. ගම—නැගෙණහිර හතලිස්පහකෝරළේ අට්ටාරගල්ල. | | | | | |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව, (නොවිකිනීම පිණිසයි.) | | | | | |
| 1 | වඳුරුස්සයාය | .. නැසීයිය ජේ. ඒරියාවේ උන්නැහ | .. හේන, පලු, කෝන් සහ කුඹුක් ස්වල්පයක් තිබේ .. | 57 | 3 | 12 | 25 |
| 2 | වඳුරුස්සයාය | .. නැසීයිය ජේ. ඒරියාවේ උන්නැහ | .. වැවට ඉතුරුකර තිබෙන හරිය .. .. | 7 | 0 | 26 | — |
| 3 | එම | .. එම | .. දියපාරට ඉතුරුකර තිබෙන හරිය .. | 15 | 1 | 24 | — |
| 4 | එම | .. — | .. පාරට ඉතුරුකර තිබෙන හරිය .. .. | 0 | 3 | 36 | — |
| | | සිතියම 4,588. ගම—නැගෙණහිර හතලිස්පහකෝරළේ අඟුරුවැල්ලැව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 1 | කෝන්ගහකුඹුර | .. (1) මහමේරුවේ සෙලප්පු, (2) රන්හාමි, (3) බණ්ඩප්පු සහ උක්කුරාල | පඟුවක් අස්වද්දපු කුඹුර | 7 | 3 | 0 | 30 |
| 2 | පලුගහකුඹුර | .. ඒරියාවේ ඩිංගිරිබන්ඩා .. | එම .. | 3 | 3 | 16 | 30 |
| 3 | එම | .. ඉහලගම මැතික්රාල ගමරාල, (2) උක්කුබන්ඩා, (3) රත්හාමිවිදානේ, (4) වන්නිහාමි, (5) රංමැනිකා සහ රංහාමි | කුඹුර .. .. | 5 | 2 | 8 | 30 |
| 5 | දුනුමඩලාගහකුඹුර | .. ඉහලගම ඩිංගිරිබන්ඩා කවුරාල සහ ඇලවූහාමි .. .. | එම .. | 5 | 0 | 4 | 30 |
| 6 | එම | .. ඒරියාවේ කලුබණ්ඩා වැබැද්දේරාල අවූසදහාමි .. .. | එම .. | 2 | 0 | 13 | 30 |
| 7 | එම | .. සිනාවාරියාගම ඒමිස්සිංඤෝ .. | එම .. | 1 | 2 | 31 | 30 |
| 8 | පලුගහකුඹුර | .. (1) ඉහලගම කලුබන්ඩා (2) අප්පුහාමි සහ මහමේරුගම කිරිබන්ඩා අවූසදහාමි | පඟුවක් අස්වද්දපු කුඹුර .. | 3 | 2 | 16 | 30 |
| 9 | කොහොඹගහකුඹුර | .. සිනාවාරිගම මෙනුහාමි වෙදරාල සහ මහමේරුවේ හේතුහාමි .. | කුඹුර .. | 2 | 0 | 26 | 30 |
| 10 | එම | .. මෙනුහාමි වෙදරාල වැඩකරනකුඹුර .. | එම .. | 2 | 3 | 26 | 30 |
| 11 | පලුගහකුඹුර | .. ඒරියාවේ බන්ඩා වැබඩරාලගේ මුදියන්සේ | පංගුවක් අස්වද්දපුකුඹුර .. | 4 | 1 | 16 | 30 |
| | | සිතියම 4,717. ගම—මීඔයෙන් එගොඩකෝරළේ මහනාන්නේරිය. | | | | | |
| 1 | ලිංවලහේන | .. පෙද්දෙගම ආර්. ඇම්. ආර්. කිරිහාමි | .. කුඹුරු අස්වැද්දීමට සෑහෙන කැලෑ ඉඩම .. | 1 | 1 | 7 | 35 |
| 3 | එම | .. එම .. .. | එම .. | 4 | 2 | 10 | 35 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව (නොවිකිනීම පිණිසයි.) | | | | | |
| 2 | කමත | .. — .. | .. පාරට සහ කමතට ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 1 | 18 | — |
| | | සිතියම 4,721. ගම—බස්නාහිර හතලිස්පහකෝරළේ මහගල්කඩවල. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 1 | විහේන්යාය | .. පිංහාමිගේ පුංචිරාල .. | .. වී ගොවිතැනට හොඳකැලය | 0 | 3 | 38 | 20 |
| 2 | එම | .. මල්හාමිගේ අප්පුහාමි .. .. | එම .. | 1 | 0 | 9 | 20 |
| | | සිතියම 4,719. ගම—පහලවිසිදෙකෝකෝරළේ ඉහල අලව්වාගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 2 | වල්පිටියහේන | .. ඒකනායකමුදියන්සේලාගේ අප්පුහාමි .. | කුඩාකැලේ .. | 4 | 1 | 15 | 30 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව (නොවිකිනීම පිණිසයි.) | | | | | |
| 1 | වල්පිටියහේන | .. — | .. පොඩිකැලේ ඇලට ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 2 | 34 | — |
| 4 | වැබඩකුඹුර | .. — | .. වැව්බැම්මට ඉතුරුකර තිබෙන හරිය කුඹුරක කොටසක් .. | 0 | 0 | 15 | — |
| | | සිතියම 4,722. ගම—මීඔයෙන් එගොඩකෝරළේ තම්මැන්නැව. | | | | | |
| 1 | තික්ගහහේන සහ තික්ගහඅමුන | .. — | .. වැව්බැම්මට ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 0 | 39 | — |
| 2 | තික්ගහහේන | .. රුක්අත්තනේ සෙල්ලවන්නිහාමිගේ බන්ඩා .. | .. කුඹුරු අස්වැද්දීමට සුදුසු කැලෑ ඉඩම .. | 2 | 0 | 23 | 25 |
| | | සිතියම 4,723. ගම—දෙමටගස්වැව. | | | | | |
| 1 | දෙමටගස්වැවහේන | .. පොතනේගම ආර්. ඇම්. මුදියන්සේ අනුමැතිරාල .. | .. කැලේ .. | 8 | 3 | 7 | 25 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව (නොවිකිනීම පිණිසයි.) | | | | | |
| 2 | එම | .. එම .. | .. වැව්බැම්මට ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 1 | 15 | — |
| | | සිතියම 4,751. ගම—මාගුල්ඔතොටකෝරළේ දන්බුවාව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 1 | දන්බුවාවේ පලුගහහේන | .. මාකෙලියාවේ ජී. පී. කිරිබන්ඩා | .. දෙනිය සහ පඳුරු සහිත ඉඩම සියඹලා, පලුගස් තිබේ | 5 | 2 | 3 | 45 |
| 2 | එම | .. — .. | .. පාරට ඉතුරුකර තිබෙනහරිය | 0 | 1 | 25 | — |
| | | සිතියම 4,018. ගම—වැලඹවිලිහත්පත්තුවේ තිරගන්දහයකෝරළේ පාලුකුඹල්පොල. | | | | | |
| 745 | කුඹල්පොලමූකලාන | .. — .. | .. — .. | 14 | 0 | 4 | 85 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව (නොවිකිනීමටයි.) | | | | | |
| 747 | එම | .. — .. | .. ඔයට ඉතුරුකර තිබේ .. | 4 | 3 | 19 | — |
| 748 | එම | .. — .. | .. පාරට ඉතුරුකර තිබේ .. | 0 | 0 | 26 | — |
| 750 | පාලුකුඹල්පොලමූකලාන | — .. | .. — .. | 5 | 1 | 10 | 85 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව (නොවිකිනීම පිණිසයි.) | | | | | |
| 751 | එම | .. — .. | .. ඔයට ඉතුරුකර තිබේ .. | 3 | 3 | 26 | — |
| 752 | එම | .. — .. | .. පාරට ඉතුරුකර තිබේ .. | 0 | 0 | 4 | — |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම 4,740. ගම—තිරගන්දහයකෝරලේ කටුපිටිය. | | | | | | |
| 1 | පුහුකොස්ගහමඩේමූකලාන | ගම්බල පිංචාවෙල්දේවයා | .. ලොකු මූකලාන .. | 1 | 2 | 2 | 45 |
| 2 | එම .. | — .. | .. ඇලට ඉතුරුකරලා තිබෙන | 0 | 1 | 29 | — |
| | සිතියම 4,088. ගම—තිරගන්දහයකෝරලේ බෙල්ගොඩකන්ද. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 1117 | ඉහලමොහොතපවමූකලාන | — .. | .. මූකලාන .. | 5 | 0 | 36 | 60 |
| | සිතියම 4,092. ගම—මහගල්බොඩමෙගොඩකෝරලේ අමුනුගම. | | | | | | |
| F 51 | අඹගහමුලහේන | .. අමුනුගම මානා. මරදෙයි | .. හේන .. .. | 4 | 0 | 34 | 30 |
| C 51 | ගල්පල්ලේහේන්වත්ත .. | එම .. | .. පොල් ඉඩම .. | 2 | 3 | 21 | 30 |
| | සිතියම 4,579. ගම—කුඩාගල්බොඩකෝරලේ මින්හෙට්ටිය. | | | | | | |
| 2 | කුඩාකකුරනේහේන | .. ආර්. ඇම්. අප්පුහාමි විදානේ | .. අවුරුදු 15ක පමණ ලොකු හේන .. .. | 3 | 1 | 17 | 20 |

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වම් 1918ක්වූ ජනවාරි මස 17වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වම්හ.

---

**No. 2,133, N.W. P.**—වයඹ දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1918ක්වූ මාර්තු මස 6වෙනි දිනවූ බදාදා පස්වරු 1ට කුරුණෑගල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පල, හිරියාල, දෙවමැදි සහ දඹදෙනි යන පලාත්වල පිහිටා තිබෙන බිම්කැබලි 41ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම 4,263. ගම—කරදපත්තුකෝරලේ යාලුවැව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 1825 | යාලුවැව | .. හන්තිහාමේ ආනා. චියන්නා. මොහමදු යූසුප් | .. හේන, අවුරුදු 20ක් පමණ වයස ඇති | 40 | 0 | 1 | 30 |
| 1825½ | එම .. | — | .. වැවුබැම්මට ඉතුරුකර තිබේ .. | 0 | 0 | 8 | 30 |
| 1827 | යාලුවැවපිටිය | .. හන්තිහාවේ ආනා. චියන්නා. මොහමදු යූසුප් | .. වැඩනොකරණ කුඹුර .. | 3 | 0 | 9 | 25 |
| 1828 | එම .. | — | .. වැවුබැම්මට ඉතුරුකර තිබේ .. | 0 | 1 | 29 | 25 |
| 1829 | යාලුවැව .. | — | .. පාලුවැව .. .. | 3 | 1 | 14 | 25 |
| 1830 | එම .. | — | .. හේන, අවුරුදු 20ක් පමණ කල්ගිය .. | 5 | 2 | 0 | 30 |
| 1831 | එම .. | — | .. එම .. .. | 0 | 3 | 0 | 30 |
| | සිතියම 4,343. ගම—යාගම්පත්තුකෝරලේ ගිනිදම්මන. | | | | | | |
| 2089 | අඹගහහේන | .. ඩබ්ලිව්. ජුවන් තිසේරා | .. හේන, අවුරුදු 10යේ පමණ පොල් ගස් 2ක් තිබේ .. .. | 2 | 3 | 14 | 51 |
| | සිතියම 4,730. ගම—යටිකහකෝරලේ කරගහගෙදර. | | | | | | |
| 1 | අඹගහමුලහේන | .. දන්ඩගමුවේ ඕ. ඇම්. පී. පෙරේරා පෙරකදෝරු මහත්මයා | .. ලොකු කැලේ .. .. | 0 | 3 | 12 | 25 |
| 3 | එම .. | — | . එම .. .. | 0 | 1 | 26 | 25 |
| 2 | එම .. | — | .. අතුපාරට ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 0 | 20 | —* |
| 4 | එම .. | — | .. කරගහගෙදර වැව්පිටිය පිණිස ඉතුරුකර තිබෙන හරිය .. | 0 | 0 | 14 | —* |
| 5 | එම .. | — | .. එම .. .. | 0 | 1 | 7 | —* |
| | සිතියම 4,756. | | | | | | |
| 1 | කහගහගෙදර වැවුපිටිය නොහොත් පුරණපිටිය .. | — | .. පාලුවැව .. .. | 2 | 0 | 13 | 30 |
| 2 | එම .. | — | .. වැව්බැම්මට ඉතුරුකර තිබෙන හරිය | 0 | 3 | 31 | —* |
| | සිතියම F. V. P. 387. ගම—කෝදුරුවාවල. | | | | | | |
| 20 | වලහවැටිච්ච කන්ද | ඒ. ඇල්. මහමදු සලිහු හජ්ජියාර් | .. මූකලාන .. .. | 5 | 3 | 6 | 50 |
| | සිතියම 4,724. ගම—උතුරු කටුගම්පොලකෝරලේ බෙරිවැව. | | | | | | |
| 2 | කෝසඅගාරේ | .. කොළඹ හෙලේන විජයවර්ධනනෝනා මහත්මයා | .. මූකලාන .. .. | 3 | 2 | 33 | 40 |
| 1 | එම .. | — | .. අඩිපාරකට ඉතුරුකර තිබෙන හරිය | 0 | 0 | 27 | —* |
| | සිතියම 4,726. ගම—දකුණු කටුගම්පොලකෝරලේ දුනුකේදෙනිය. | | | | | | |
| 1 | රත්මල්වලකැලේ . | දුනුකේදෙනියේ ඇස්. ඇම්. බී. අප්පුහාමි | .. මූකලාන, කහට සහ මිල්ලගස් තිබේ .. | 10 | 0 | 0 | 60 |
| | අයිතිකමකියන්නා—නොම්මර 238,398 දරණ ප්ලෑනේ ඉඩම් අයිතිකාර ඩී. පී. විජේගුනවර්ධන උන්නැහේ (ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගන තිබෙන හරිය). | | | | | | |
| 2 | කහටගහවත්ත .. | — | .. පොල්පැල 9ක් තිබේ .. | 0 | 0 | 11 | 85 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 3 | රත්මලවලකැලේ . | — | .. ගම්සභාපාරට ඉතුරුකර තිබෙන හරිය | 0 | 0 | 24 | —* |
| | සිතියම 4,334. ගම—කරදපත්තුකෝරලේ පල්ලේගම. | | | | | | |
| 2075 | පහලවෙල .. | එළුවාපොල එච්. ඩී. පෙරුමා | .. කුඹුර, තැනින්තැන කැලේ තිබේ .. | 7 | 1 | 22 | 80 |
| | සිතියම 4,598. ගම—කරදපත්තුකෝරලේ මැද්දේගම. | | | | | | |
| 1 | බෝගහමුලහේන .. | මැද්දේගම විකිරි දූරයා | .. කැලේ .. .. | 9 | 1 | 11 | 25 |

* නොවිකිණීම පිණිසයි.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|

සිතියම 4,598. ගම—කරදපත්තුකෝරළේ මැදගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | පාළුවැවහේන .. | මැදගම ටිකිරිදුරයා | .. කැලේ .. | .. 1 | 3 | 37 | 25 |

සිතියම 4,712. ගම—යටිකහකෝරළේ ආඩියාගල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ආඩියාගල බෙලිඅකුල .. | කෝඳුරුවාපොල ඒ. ඇම්. කිරිහාමි | හේන සහ කුඩාකැලේ | .. 1 | 1 | 1 | 38 |

සිතියම 4,593. ගම—මැද්දේකැටියකෝරළේ ලන්කාරන්ගෙදර.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | යාගම්පොලපිටියෑව | පුන්චිරාල ආරච්චි | .. වැවීමට සෑහෙන හේන | .. 0 | 2 | 0 | 32 |
| 2 | එම .. | එම | .. එම .. | .. 1 | 2 | 7 | 32 |
| 3 | එම .. | — | .. ගම්සභාපාරට ඉතුරුකර තිබෙන හරිය | 0 | 0 | 7 | —* |
| 4 | එම .. | — | .. එම .. | .. 0 | 0 | 4 | —* |

සිතියම 4,614. ගම—දකුණු කටුගම්පලකෝරළේ උඩදෙනිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ උඩදෙනියේ සිඤ්ඤප්පු.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | පොසිය මුල්ලේ හේන .. | මාරවිල එච්. පී. වික්‍රමසිංහ උන්නැහෙ | හේන .. | .. 6 | 1 | 0 | 30 |
| 2 | පොසිය මුල්ලේ මූකලාන .. | එම | .. මූකලාන ලී කැපීමට ඉතුරුකර තිබේ | 16 | 0 | 18 | —* |

අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ උඩදෙනියේ ජේ. ඒ. උඩදෙනිය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | කෝංගහමුලහේන | — | .. එලිකල හේන .. | .. 5 | 0 | 22 | 30 |

සිතියම 4,437/230. ගම—දකුණු කටුගම්පොලකෝරළේ පලුගොමුව. අයිතිකමකියන්නා—මාඩම්පේ මහාමාලගේ ප්‍රන්සිස් සාලිස් පෙරේරා.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| B 105 | නුගගහමුලවත්ත .. | මාඩම්පේ මහාමාගලගේ ප්‍රන්සිස් සාලිස් පෙරේරා .. | .. පොල් ඉඩම .. | .. 5 | 0 | 10 | 20 |

සිතියම 4,402. ගම—හිරියාලහත්පත්තුවේ ඉහල විසිදෙකේකෝරළේ මීපිටිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2380 | බෝගහමුලහේන නොහොත් රජ සන්තක හිඟුර | හෙනගෙදරපතිරනනැහෙලාගේ සරපීනු පෙරේරා අප්පුහාමි | .. කුඩාකැලේ .. | .. 8 | 0 | 29 | 40 |

සිතියම 4,422. ගම—තිත්තවැලි ගන්දහයේකෝරළේ ඇහැටුගස්යාය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2437 | කුඹුක්බෙනේ .. | තිත්තවැල්ලේ රංහාමි ගන්ආරච්චි | වගුරුසහිත හේන වී වැපිරීමට සෑහේය | 4 | 3 | 29 | 65 |

සිතියම 4,577. ගම—හැටහයේකෝරළේ අඹම්පොල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | මීගොන්ගාල .. | අඹම්පොල ගලපිටදුරයලාගේ හොරතලා .. | .. හේන .. | .. 1 | 0 | 27 | 100 |

සිතියම 4,595. ගම—නිකවාගම්පහකෝරළේ රක්වාන.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | පළුගහකොටුව .. | කම්බුවටවන බස්නායක මුදියන්සෙලාගේ හේරත්හාමි සහ වටුවත්තේ ගම යාපාමුදියන්සෙලාගේ කළුබන්ඩා .. | .. කැලේ, පළු සහ මිල්ල තිබේ | .. 11 | 1 | 22 | 25 |

සිතියම 4,615. ගම—දිවිගන්දහයේකෝරළේ රඹේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | මීගහමුලහේන .. | කුඹුක්වැවේ ම්යෝනිස් ද සිල්වා විජේරත්න .. | .. හේන ලොකුගස් ස්වල්පයක් තිබේ | .. 5 | 1 | 7 | 30 |
| 3 | එම .. | එම | .. එම .. | .. 16 | 2 | 27 | 30 |
| 5 | එම .. | එම | .. අවුරුදු 15වේ පොල්ගස් 9ක් තිබේ .. | 0 | 0 | 39 | 200 |

සිතියම 4,771. ගම—ඉහල විසිදෙකේකෝරළේ උඩත්තාපොල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | හුනුගහමුලහේන .. | උඩත්තාපොල හොඳගේ ඩිංගිරියා | වත්ත අවුරුදු 1කේ පොල් සහ කෙහෙල් තිබේ .. | .. 2 | 2 | 6 | 300 |
| 2 | ඉඹුල්ගහමුලහේන | උඩත්තාපොල ඒ. පී. සෝදියා සහ උක්කු .. | .. වත්ත අවුරුදු 1කේ සිට 10යේ පොල් සහ කෙහෙල් තිබේ | .. 3 | 3 | 6 | 150 |
| 3 | හෝදිය කුඹුරේ හේන .. | උඩත්තාපොල හොඳගේ ඩිංගිරියා, ඒ. පී. සෝදියා සහ උක්කු | .. හේන අවුරුදු 3ක පමණ | .. 1 | 0 | 37 | 50 |

සිතියම 4,611. ගම—තිස්සවකෝරළේ දෙරබාවිල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | දෙරබාවිලමූකලාන | වී. ඇන්. රනතුංග | .. පොල්වැවීමට හොඳ මූකලාන | .. 3 | 0 | 12 | 40 |

සිතියම 4,734. ගම—දේවමැද්දෙකෝරළේ මල්වාන.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | වෙරළුගොල්ලෙ කැලේ .. | මල්වානේ ඇම්. ආර්. ඇම්. බී. පුංචි බන්ඩා .. | .. තරමක කැලේ කිනගස් ස්වල්පයක් තිබේ .. | .. 6 | 2 | 0 | 30 |
| 2 | එම .. | — | .. අඩිපාරකට ඉතුරුකර තිබෙන හරිය | 0 | 0 | 6 | —* |

සිතියම 4,426/233. ගම—දේවමැද්දෙකෝරළේ නාවින්න. අයිතිකමකියන්නා—නාවින්නේ රජපක්‍ෂමුදියන්සේලාගේ මුදියන්සේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| O 97 | කහටගසිමුලහේන | නාවින්නේ රජපක්‍ෂමුදියන්සේලාගේ මුදියන්සේ .. | .. කුඩාකැලේ .. | .. 15 | 0 | 2 | 20 |
| O 97⅓ | එම .. | එම | .. එම .. | .. 1 | 2 | 31 | 20 |
| P 97 | මාවකවත්ත .. | එම | .. පොල් ඉඩම .. | .. 0 | 0 | 18 | 15 |
| Q 97 | එම .. | එම | .. එම .. | .. 0 | 0 | 20 | 15 |

අයිතිකමකියන්නා—මල්වානේ ආර්. ඇම්. බී. පුංචිබන්ඩා නාවින්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| O 97½ | කහටගහමුලහේන | මල්වානේ ආර්. ඇම්. බී. පුංචිබන්ඩා නාවින්න .. | .. හේන .. | .. 6 | 1 | 23 | 20 |

* නොවිකිණීම පිණිසයි.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහජ්ජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 17වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඒ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්භ.

**No. 1,247, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මාර්තු මස 1වෙනි දිනවූ සිකුරාද දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ, වැල්ලවාය, යටිකිඳ සහ වෙල්ලස්ස කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 29ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| **අන්තිම සිතියම 32. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ ගවුඟහගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | | | | |
| 16 | බොමුගොල්ලේපතන | ඩී. බී. ගවුඟහ හිටපු රටේමහත්මයා | පතන | 3 | 0 | 39 | 35 |
| 16*a* | එම | — | පතන, ගම්සභාපාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 1 | 1 | —* |
| **සිතියම 1,892. ගම—වැල්ලවාය පලාතේ කන්දපල්ලකෝරලේ නිකපොතගම.** | | | | | | | |
| 6 | ලීනියඅන්දනගලවත්ත | ඉලිසබත් රාජපක්ෂ | සිහින්කැලේ | 1 | 0 | 17 | 35 |
| **අන්තිම සිතියම 170. ගම—යටිකිඳ රිල්පලකෝරලේ වැදිගුනේගම. අයිතිකමකියන්නා—වැදිගුනේ ජී. සුවාරිස්හාමි.** | | | | | | | |
| 35*q* | වැවඅරාවවත්ත | — | අවුරුදු 10ක් වයස්වූ තේ තිබේ | 0 | 2 | 28 | 500† |
| **අන්තිම සිතියම 60. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ යල්පත්වෙලගම. අයිතිකමකියන්නා—විලියම් දුනුවිල දිසානායක මහත්මයා.** | | | | | | | |
| 4*n* | ඉද්දමන්කඩකුඹුර | — | කුඹුර | 0 | 0 | 27 | 300 |
| **අන්තිම සිතියම 164. ගම—වෙල්ලස්ස පලාතේ මැදගම්පත්තුකෝරලේ පිටදෙනියේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | | | | |
| 14*q*1 | වරලන්දේහේන | වැලිවත්තේ එච්. ඇම්. තිසාහාමි | හේන | 2 | 0 | 0 | 20 |
| 14*q*2 | එම | ගමගෙදර ඩබ්ලිව්. ඇම්. අප්පුහාමි | එම | 1 | 1 | 8 | 20 |
| 14*q*3 | එම | — | හේන, මහපාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 9 | —* |
| 14*q*4 | එම | — | එම | 0 | 0 | 28 | —* |
| 23*av* | නාගහවෙලපිටියේහේන | එච්. ඇම්. තිසාහාමි | හේන | 3 | 1 | 13 | 20 |
| 23*aw* | එම | — | හේන, පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 1 | 17 | —* |
| 23*ax* | නම්බලකැටියේඇල්ල | ඩබ්ලිව්. ඇම්. මුතුබන්ඩා | හේන | 1 | 0 | 11 | 20 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, ඩබ්ලිව්. ඇම්. මුතුබන්ඩා විසින් අල්ලාගෙන තිබේ.** | | | | | | | |
| 23*ay* | නාගහඇල්ල | — | වත්ත, අවුරුදු 3ක් වයස්වූ කොස්ගස් කෙසෙල්ගස්ද තිබේ | 0 | 3 | 10 | 60 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | | | | |
| 23*ae* | තනවත්තේහේන | — | හේන, ඔයට ඉතුරුකරතිබේ, විකිනීමට නොවේ | 0 | 2 | 37 | —* |
| 23*ae*1 | එම | එච්. බඩපිහිරාල | හේන | 1 | 0 | 1 | 20 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, පී. අප්පුහාමි විසින් අල්ලාගෙන තිබේ.** | | | | | | | |
| 23*ae*2 | වත්තේගෙදරවත්ත | — | අවුරුදු 50ක් වයස්වූ පොල්ගස් 3ක්ද, අවුරුදු 6ක් පමණ වයස්වූ පොල්ගස් 2ක්ද, අවුරුදු 50ක් වයස්වූ කොස්ගස් 4ක්ද, පුවක්ගස්ද, කෙසෙල්ගස්ද තිබේ | 0 | 3 | 7 | 60 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | | | | |
| 23*ae*3 | එම | — | හේන | 0 | 0 | 34 | 20 |
| **අන්තිම සිතියම 117. ගම—උඩුකිඳ මහපලාතකෝරලේ දිගනේතැන්නගම.** | | | | | | | |
| 2*j* | කන්දකැපුගොඩපතන | බී. අප්පුහාමි | හේන, කෙසෙල්ගස් 25ක් තිබේ | 1 | 0 | 38 | 40 |
| 2*k* | එම | — | හේන, ගම්සභාපාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 12 | —* |
| 2*l* | එම | — | එම | 0 | 0 | 10 | —* |
| 2*m* | එම | — | හේ | 1 | 0 | 7 | 40 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, යූ. සිරිබද්දන විසින් අල්ලාගෙන තිබේ.** | | | | | | | |
| 2*n* | දේනාවේවත්ත | — | අවුරුදු 25ක් වයස්වූ කොස්ගස් 4ක්ද, කිතුල්ගස්ද, කෙසෙල්ගස්ද තිබේ | 0 | 1 | 32 | 41 |
| 2*o* | මැදවත්ත | — | වත්ත, බතල වවා තිබේ | 0 | 0 | 12 | 40 |
| **අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | | | | |
| 2*p* | එම | — | හේන, ඇලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 3 | —* |
| 12*d* | නාවෙලගෙදරහේන නොහොත් නාඅරාවහේන | පී. ඇම්. උක්කුබන්ඩා | හේන සහ පතන | 0 | 3 | 26 | 40 |
| 12*e* | එම | — | හේන සහ පතන, ඇලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 21 | —* |
| **සිතියම 1,941. ගම—වැල්ලවායපලාත වැල්ලවායකෝරලේ තෙල්උල්ලේගම.** | | | | | | | |
| 1 | සියඹලාගස්මන්ඩිය නොහොත් වැවගාවාකැලේ | පී. බී. පීටර් | මිල්ල, දඹ සහ බුරුත තිබෙන කැල්ල | 1 | 0 | 0 | 25 |
| 2 | එම | — | සිහින් කැලෑව, පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 12 | —* |
| 3 | එම | — | කැලෑව, වැවට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 1 | 22 | —* |

* නොවිකුනා ඉතුරුකිරීමට. † දෙවෙනි වතාවට ප්‍රසිඩකළා ඇත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 17වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්භ.

**No. 972, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මාර්තු මස 4වෙනි දිනවූ සඳුදා පස්වරු 1ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බෙරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ පිහිටා තිබෙන බිම්කැබලි 12ක්.

මුල් සිතියම 2,724. ගම—කැටලියන්පල්ල, කුරුවිටිකෝරළේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | නාවින්නෙකැලේ | .. ජී. ඒ. පීරිස් මහත්මයා .. | .. කැලෑව .. | .. 6 0 28 | 100 |
| | | මුල් සිතියම 2,712. ගම—රත්වල, අටකලන්කෝරළේ. | | | |
| 1 | ගොඩහෙරලියගහ මන්ඩිය | කේ. අන්දිරිසා .. | .. වැව්වව කැලෑව .. | .. 1 0 7 | 20 |
| 2 | එම | .. — .. | .. එම .. | .. 0 0 9 | —* |
| | | මුල් සිතියම 2,707. ගම—පන්නිල, අටකලන්කෝරළේ. | | | |
| 1 | නෙළුකැටියේහේන | .. ඇම්. ඇල්. මොහොට්ටිහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | .. බතල, ඉඟුරු යනාදිය වවාතිබෙන ඉඩම | 0 2 16 | 20 |
| 2 | නෙළුකැටියේවත්ත | .. ඇම්. ඇල්. පුංචිඅප්පුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | අවුරුදු 3 සිට 5 දක්වා වයස ඇති පොල් .. පුවක් යනාදිය තිබෙන වත්ත | .. 0 2 3 | 35 |
| | | මුල් සිතියම 2,218. ගම—පින්නවල, කඹවතුකෝරළේ. | | | |
| 736 | දෙබැකිනමූකලාන | .. ව්, ඇම්. ඇල්. කුරේ .. | .. මූකලාන සහ කැලෑව | .. 0 1 6 | 65 |
| | | මුල් සිතියම 2,614. ගම—දිගඳුර, මැදකෝරළේ. | | | |
| 1 | දිගඳුරමූකලාන | .. මාගිරිස් අප්පුහාමි .. | .. කැලෑව .. | .. 2 2 33 | 65 |
| 1a | එම | — — .. | .. එම .. | .. 0 1 6 | —† |
| 1b | එම | .. — .. | .. එම .. | .. 0 1 13 | 65 |
| 1c | එම | .. — .. | .. එම .. | .. 1 3 39 | 65 |
| 2 | එම | .. — .. | .. එම .. | .. 0 1 4 | —* |
| | | සිතියම 2,631. ගම—බුලත්ගම, මැදකෝරළේ. | | | |
| 1 | කෙහෙල්ගස්හේන | .. සන්දනම් පුල්ලේ විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කෑල්ල .. | .. අවුරුදු පහක් පමණවූ තේ වාපුඉඩම | .. 3 2 33 | 250 |

* ගමසභාපාර ආරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ.

† වෙල්ල ආරක්ෂක බිම්කැබෙල්ල සහ වෙල්ල. විකුණනු නොලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ ජනවාරි 23මස වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 4 වෙනි දින නිකුත්කරණලද නොම්මර 6,918වේ ගැසැට් පත්‍රයේ සඳහන් උතුරු මධ්‍යම දිසාවේ ලංකාමැනීමේ මුල් සිතියමේ නොම්මර 573ගේ කිරිගොල්ලෑවේ අංක 6 දරණ ඉඩම්කට්ටියේ බදුදීම වර්ෂ 1918ක්වූ පෙබ්‍රවාරි මස 16වෙනි දින නොව එම මස 12වෙනි දින බව දැනගත යුතුයි.

ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණ පරිදි,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහ ලේකම්තාරිස්තැන වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පිඹුරේ ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවේ සොහොන් භූමියට යෑම් සඳහා පාරක් දැමීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියම 16,594. ගම—පිඹුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලියන්ගහවත්ත .. | අඩිපාර .. | දෙන් කොර්නෙලිස් සහ තවත් අය .. | 0 0 14·1 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ පෙබ්‍රවාරි මස 25වෙනි දින පස්වරු 1ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 12වෙනි දින
කළුතර කච්චේරියේදීය.

සී. වී. බ්‍රේන්
ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බදුළු රේල්පාර කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

ලංකාමැනීමේ සිතියම 2. ගම—යටිකිඳ කුඹල්වෙලකෝරළේ ගොවුවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| M1 | උඩුතුරේකුඹුර සහ මූලතේකුඹුර .. | කුඹුර .. | ඉළුපැලැස්සේවත්තේ කොටදන්ඩේගෙදර දිලිසිහා, අප්පුහාමි, කිරිමැනිකා, කුමා සහ ඇම්. ඩී. ඇස්. වික්‍රමසූරිය .. | 0 0 25 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 20වෙනි දින දවල් 1ගේ කනිසමට බදුලු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 19වෙනි
දින බදුලු කච්චේරියේදීය.

ඇෆ්ජ්. බාව්ලව්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්තවම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[හම්බන්තොට දැන්වීම නො. 6,750.]

වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම්අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ පලාතොට යන ගම පිහිටාතිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 16½ .. | දෙවට .. .. .. .. .. | 0 0 11 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු ලෝළුගහවත්තද, ගිගනගමගේ ඩිංගිහාමි සහ තවත් අය විසින් අයිතිකම් කියන කළුඅප්පුගේවත්තද; නැගෙණහිරට ගුරුසින්ආරච්චිගේ ඩිංගිඅප්පු විසින් අයිතිකම්කියන කළුඅප්පුවාගේදෙනියද; දකුණට අල්ලාවලගමගේ බබාහාමි විසින් අයිතිකම්කියන හේනවත්ත නොහොත් නුගහේනද, තලවිටගේ ජයසින්හාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දන්ගහවත්තද, ලියනගේ ඩිංගිබබා සහ තවත් අය විසින් අයිතිකම්කියන ලෝළුගහදෙනියද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු ලෝළුගහවත්තේකැබෙල්ලද.

II.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 19½ .. | පාර .. .. .. .. .. | 0 0 10 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ ආරේගමගේ සිලින්දුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන දුනුමඩලගහවත්තද; නැගෙණහිරට 202,352 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; දකුණට ආණ්ඩුව විසින් විකුනාපු කපුහේනද, (ප්‍රවෙනි) කපුහේනද, (ප්‍රවෙනි) හේනවත්ත නොහොත් නුගගහවත්තද; බස්නාහිරට ගුරුසින්ආරච්චිගේ ඩිංගිඅප්පු විසින් අයිතිකම්කියන කළුඅප්පුදෙනියඅත්මගද.

III.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 30 .. | කොටිගලේහේනේවැව නොහොත් කිවුල්ආරේලැබීමේවැව .. .. | 0 2 18 |

මීට මායිම්—උතුරට එදිරිසිංහ දෙන් සාමෙල් සහ තවත් අය විසින් අයිතිකම්කියන නුගහේනද; නැගෙණහිරට එදිරිසිංහ දෙන් සාමෙල් සහ තවත් අය විසින් අයිතිකම්කියන කිවුලේආරේදෙනියද, එම අය විසින් අයිතිකම්කියන අඹේහේනද; දකුණට සහ බස්නාහිරට එදිරිසිංහ දෙන් සාමෙල් සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහහේනද.

IV.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 33½ .. | දෙවට .. .. .. .. .. | 0 0 11 |

මීට මායිම්—උතුරට (ප්‍රවෙනි) මොරගහකුඹුරද, රජසන්තක මොරගහහේනේකැබෙල්ලද; නැගෙණහිරට 201,862 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද, වීරසිංහ නිකුලස්හාමි විසින් අයිතිකම්කියන ඇමපිල්ලාවත්තද; දකුණට වීරසිංහ නිකුලස්හාමි විසින් අයිතිකම්කියන ඇමපිල්ලාවත්තද, එම අය සහ තවත් අය විසින් අයිතිකමකියන ඇමපිල්ලාවත්තද; බස්නාහිරට (ප්‍රවෙනි) මාරගහකුඹුරද.

V.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 44½ .. | දෙවට .. .. .. .. .. | 0 0 23 |

මීට මායිම්—උතුරට අමරසේකරකන්කානන්ගේ දෙන් පෙනේරිස් විසින් අයිතිකම්කියන ඉත්තෑබනහේනද, ආණ්ඩුව විසින් විකුනාපු රුක්අත්තනගහවත්තද, (324,512 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); නැගෙණහිරට රජසන්තක ගොඩවානේකොරටුවද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු දඹේවැවද; දකුණට රුවන්පතිරනගේ බබාප්පු විසින් අයිතිකම්කියන මැදදූවවත්තද, එම අය සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන ලෝළුගහකොරටුවකැබෙල්ලද, රජසන්තක ලෝළුගහවත්තද; බස්නාහිරට රජසන්තක ලෝළුගහවත්තද, ආණ්ඩුව විසින් විකුනාපු නාරන්ගහවත්තද, කළුතන්ත්‍රිආරච්චිගේ අල්ලිස්අප්පු විසින් අයිතිකම්කියන කඹුදූවගේවත්තද.

VI.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 59½ .. | පාර .. .. .. .. .. | 0 0 6 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු කරගහකොරටුවකැබෙල්ලද, (324,790 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) නැගෙණහිරට රජසන්තක ලෝළුගහවත්තද; දකුණට ආණ්ඩුව විසින් විකුනාපු කැටකාලවත්ත නොහොත් මලපලාවද, (325,892 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); බස්නාහිර බඩතුරුගේ සවුන්ද්‍රිසා විසින් අයිතිකම්කියන කරගහකොරටුවද.

VII.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 95½ .. | දෙවට .. .. .. .. .. | 0 0 32 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු පින්නවැටියවත්තකැබෙල්ලද, (325 019 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුනාපු පින්නකැටියවතතකැබෙල්ලද, (325,019 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) දෙකෙන් පංගුවේ තක්සේරුවට දීපු පින්නකැටියවත්තද, (326,605 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); දකුණට වන්නිආරච්චිගේ දෙන් සලමොන් සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහවත්තද; බස්නාහිරට වන්නිආරච්චිගේ දෙන් සලමොන් සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහවත්තද, කළුගමගේ දෙන් තිලෝරිස් විසින් අයිතිකම්කියන ලියනගහවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 83—92වෙනි පිටුවල ප්ලෑන් බලනු.

## VIII.—මුල් සිතියම 309.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 111 | ඉහලදෙනියවැව නොහොත් රදවිහිටියවත්තගාවාවැව (වැව සහ කන්ඩිය) | 0 3 15 |
| 111A | ඉහලදෙනියවැවේකැල්ල | 0 2 7 |
| 190C | නුගේහේන (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) | 0 0 21 |
| 197 | ගන්සභාපාර | 3 1 3 |
| | | 4 3 6 |

